# වාරිමාර්ග අමාත්‍යාංශය

# ඇබෑර්තු

## ගිං, නිල්වලා හැරවුම් ව්‍යාපෘතියේ ඇබෑර්තු

ගිං, නිල්වලා ගංගා ධාරයන්හි අතිරික්ත ජලය ගිනිකොනදිග වියළි කලාපයට හැරවීම සඳහා ගිං, නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශ්‍ය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

වාරිමාර්ග අමාත්‍යාංශය හා ජල සම්පත් කළමනාකරණ ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන ගිං, නිල්වලා හැරවුම් ව්‍යාපෘතියේ (GNDP) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ (PIU) පවතින පහත සඳහන් ඇබෑර්තු සඳහා යථාපරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඒ සඳහා අයදුම්පත් මෙමගින් කැඳවනු ලැබේ.

1. **ජ්‍යෙෂ්ඨ ඉඩම් නිලධාරී (PS5) - තනතුරු 01 යි, ජ්‍යෙෂ්ඨ සමාජ නිලධාරී (PS5) තනතුරු 01 යි සහ ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරී (PS5) තනතුරු 01 යි.**

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද.**

**පහත සඳහන් I හෝ II හෝ III**

I විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය.

හෝ

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාන සුදුසුකමක්.

හෝ

අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තිමය ආයතනයක් මගින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය සමාන වෘත්තිමය සුදුසුකමක්

හෝ

තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සමග

විශේෂඥතාවය ලැබිය යුතු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්ද.

II තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරු සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ, ජාතික වෘත්තීය කුසලතා 6 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සමග

විශේෂඥතාවය ලැබිය යුතු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 11 ක පළපුරුද්ද තාක්ෂණ ක්ෂේත්‍රයට සම්බන්ධ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සමග

විශේෂඥතාවය ලැබිය යුතු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද.

**වැටුප් තලය :** PS5-රු. 105,000.00 - 113,000.00 MSD චක්‍රලේඛ අංක 01/2019 අනුව)

**පොදු කොන්දේසි :**

(1) **වයස :** අයදුම්කරුවන් අවම වශයෙන් අවුරුදු 21 විය යුතු අතර වයස අවුරුදු 60 ට නොවැඩි විය යුතුය.

(2) **වැටුප් පරිමාණය :** 2019-03-15 දනම දරන පරිපාලන සේවා චක්‍රලේඛ අංක 01/2019 අනුව රජය විසින් අනුමත වැටුප් පරිමාණය දීමනා සමග

(3) වාරිමාර්ග ක්ෂේත්‍රයේ ව්‍යාපෘතීන්හි පළපුරුද්ද ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

(4) මෙම තනතුරු ආරම්භක වශයෙන් වසර 01 ක කාලපරිච්ඡේදයක් සඳහා පූර්ණ වසයෙන් කොන්ත්‍රාත් පදනම මත වන අතර ව්‍යාපෘතියේ අවශ්‍යතා හා කාර්ය සාධනය මත පදනම්ව දීර්ඝ කිරීමේ ශක්‍යතාව ඇත.

(5) මෙම තනතුරු සඳහා කාර්යාලීය හා ක්ෂේත්‍රය මත පදනම් වූ රාජකාරී ඇතුළත් වේ. රාජකාරී ස්ථානය ගාල්ලේ පිහිටි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIU) වන අතර සෑම නිලධාරියකු විසින්ම ඉටුකළ යුතු කාර්යයන් සඳහා (නෙළුව / කොටපොල / පස්ගොඩ / වීරකැටිය) වැනි ව්‍යාපෘති ක්ෂේත්‍රයන්හි රාජකාරී අවශ්‍යතාවන් මත සේවය කිරීමට සිදුවනු ඇත.

**අයදුම්පත් එවිය යුතු ආකාරය**

අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අධ්‍යාපනික, වෘත්තිමය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතික හා ඥාතීන් නොවන විමර්ශකයන් දෙදෙනෙකුගේ ඇමතුම් තොරතුරු සමග ලැබීමට සැලැස්විය යුතුය. උපරිම සුදුසුකම් අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර තෝරා ගැනීම් කුසලතා මත පදනම්ව සිදු කරනු ලැබේ. රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩල / සංස්ථා හෝ වෙනත් රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතනයන්හි ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු අතර තෝරාගනු ලැබුවහොත් එම අයදුම්කරුවන් පූර්ණකාලීනව නිදහස් කළ හැකිද යන්න සඳහන් කළ යුතුය.

යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ව්‍යාපෘති අධ්‍යක්ෂ, ගිං, නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය, නො. 11, ජාවත්ත පාර, කොළඹ 05 යන ලිපිනයට **2022 මාර්තු** මස **31** වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයෙහි වම්පස උඩු කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය,**
**නො. 11, ජාවත්ත පාර,**
**කොළඹ 05.**